# සමාජ සේවා දෙපාර්තමේන්තුව

කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය

වෘත්තීය උපදේශක (III ශ්‍රේණිය)/නිවාස පාලක (III ශ්‍රේණිය)

සමාජ සේවා දෙපාර්තමේන්තුවේ කිලිනොච්චි දිස්ත්‍රික්කයේ ආරම්භ කර ඇති ආබාධ සහිත පුද්ගලයින් සඳහාවන වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය සඳහා වෘත්තීය උපදේශක තනතුරු 02ක් හා නිවාස පාලක තනතුරු 01ක් සඳහා බඳවා ගැනීමට ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

පහත දැක්වෙන ආකෘතිය අනුව සකස් කරන ලද අයදුම්පත් අධ්‍යක්ෂ, සමාජ සේවා දෙපාර්තමේන්තුව, 02 වන මහල, II වන අදියර, සෙත්සිරිපාය, බත්තරමුල්ල යන ලිපිනයට **2023.11.30** දිනට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහා එවන කවරයේ වම්පස ඉහල කෙලවරේ "වෘත්තීය උපදේශක (III ශ්‍රේණිය) / නිවාස පාලක (III ශ්‍රේණිය) සඳහා බඳවා ගැනීම්'' යනුවෙන් සඳහන් කර තිබිය යුතුය. www.socialservice.gov.lk වෙබ් අඩවිය හරහා ද ආදර්ශ අයදුම්පත් හා විස්තර ලබා ගත හැක.

මෙම තනතුරට බඳවා ගැනීම සඳහාවන සුදුසුකම් :-

1. වෘත්තීය උපදේශක (02) (ඇඳුම් මැසීමේ ශිල්පය, තොරතුරු තාක්ෂණය)

1.1 වයස් සීමාව :-

අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු සහ 35 ට නොවැඩි විය යුතුයි.

1.2 අධ්‍යාපන සුදුසුකම් :-

(අ) වෘත්තීය උපදේශක (ඇඳුම් මැසීමේ ශිල්පය, තොරතුරු තාක්ෂණය) තනතුරු සඳහා අධ්‍යාපන සුදුසුකම්

(i) සිංහල/දෙමළ භාෂාව, ගණිතය සහ තවත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථයක් සහිත ව එක් වරක දී විෂයයන් හය (06) කින් සහ අ.පො.ස.(සා.පෙළ) විභාගය සමත් ව තිබීම ;

සහ

(ii) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී ඕනෑම විෂය ධාරාවකින් සියලුම විෂයයන්ගෙන් (සාමා-න්‍ය පොදු පරීක්ෂණය හැර) සමත් ව, තෘතියික අධ්‍යා-පන පාඨමාලාවක් හැදෑරීම සඳහා අවශ්‍ය සාධන මට්ටම ලබා තිබීම.

1.3 වෘත්තීය සුදුසුකම් :-

අදාළ වෘත්තීය පිළිබඳ ලංකා කාර්මික විද්‍යාලයෙන් හෝ ජර්මන් කාර්මික අභ්‍යාස ආයතනයේ දෑ අවුරුදු හෝ ඊට වැඩි සහතික පත්‍රය ;

හෝ

කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවේ හෝ පේෂකර්ම දෙපාර්තමේන්තුවේ දෑ අවුරුදු හෝ ඊට වැඩි සහතික පත්‍රය ;

හෝ

සමාජ සේවා දෙපාර්තමේන්තුව හෝ ජාතික තරුණ සේවා සභාව හෝ ඊට අනුබද්ධ ආයතන මගින් පවත්වනු ලබන දෑ අවුරුදු හෝ ඊට වැඩි පාඨමාලා සහතික පත්‍රය ;

හෝ

වෘත්තීය පුහුණු අධිකාරිය හෝ ඊට අනුබද්ධ ආයතනයකින් ලබා ගත් අදාළ වෘත්තීය පිළිබඳ දෑ අවුරුදු හෝ ඊට වැඩි සහතික පත්‍රය ලබා තිබීම ;

හෝ

තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන ජාතික වෘත්තීය කුසලතා (NVQ) පහ (05) මට්ටමට ඇතුළත් වන්නා වූ අදළ තාක්ෂණික පාඨමාලාවක් හෝ ඒ හා සමාන යැයි තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන පාඨමාලාවක් සාර්ථකව හදරා සහතික ලබා තිබීම.

1.4 පළපුරුද්ද :- අදළ නොවේ.

1.5 කායික සුදුසුකම් :-

සෑම අපේක්ෂකයෙකු ම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික සෞඛ්‍ය තත්වයකින් යුක්ත විය යුතුය.

1.6 වෙනත් :-

i. ශ්‍රී ලාංකික පුරවැසියෙකු වීම
ii. අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත වීම
iii. තනතුරට බඳවාගැනීම සඳහා වන 1.1 සිට 1.6 දක්වා වන සියළුම සුදුසුකම්, එම සුදුසුකම්, සම්පූර්ණ කළ යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ / *ගැසට්* පත්‍රයේ සඳහන් කරනු ලබන දිනට සෑම ආකාරයකින් ම සම්පූර්ණ කර තිබිය යුතුය.

1.7 බඳවා ගැනීමේ ක්‍රමය :-

ලිඛිත හා වෘත්තීය පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ. පළමුව ලිඛිත පරීක්ෂණය පැවැත්වේ. ලිඛිත පරීක්ෂණයෙන් සමත් වූවන් අතරින් ඉහලම ලකුණු ලැබූ, කුසලතා අනුපිළිවෙල අනුව පවතින පුරප්පාඩු සංඛ්‍යාව මෙන් දෙගුණයක් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයෙන් සුදුසුකම් ලැබූවන් පමණක් වෘත්තීය පරීක්ෂණයට යොමු කරනු ලැබේ. වෘත්තීය පරීක්ෂණයෙන් ද සමත් වූවන් ඔවුන් ලිඛිත පරීක්ෂණයේ දී ලබා ගත් ලකුණු වලත් වෘත්තිය පරීක්ෂණයේ දී ලබා ගත් ලකුණුවලත් මුලු එකතුව අනුව කුසලතා අනු පිළිවෙලින් පුරප්පාඩු සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් පුහුණු පාඨමාලාව සඳහා තෝරා ගනු ලැබේ. එම පිරිස මාස 03ක් ඉගැන්වීමේ ක්‍රම පිළිබඳ පුහුණු පාඨමාලාවක් හදරා සාර්ථකව නිම කර සහතිකයක් ලබා ගත යුතුය. එසේ සහතික ලබා ගන්නා අයදුම්කරුවන් පමණක් තනතුරට බඳවා ගනු ලැබේ.

1.7.1 ලිඛිත පරීක්ෂණය :-

| විෂයයන් | කාලය | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| බුද්ධි පරීක්ෂණය | පැය 01 | 100 | 40% |
| අවබෝධය | පැය 02 | 100 | 40% |

1.8 වැටුප් ප්‍රමාණය :-

රා.ප.ච. 03/2016 අනුව MT - 01- 2016 වැටුප් ප්‍රමාණය රු.29,840-10x300-11x350-10x560-10x660-රු. 48,890/= වේ.

1.9 සේවා කොන්දේසි :-

මෙම තනතුර ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතය, විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට යටත් විය යුතු අතර වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දයක මුදල් ගෙවිය යුතුය. රා.ප.ච. 01/2014 හා ඊට අනුශංගික චක්‍රලේඛ අනුව වසර පහක් තුළ නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබාගත යුතුය.

1.10 සටහන :-

- සමාජ සේවා අධ්‍යක්ෂ විසින් තීරණය කරනු ලබන ආයතනයක් මගින් ලිඛිත පරීක්ෂණය කොළඹ දී පැවැත්වේ.

- ඉහත සඳහන් සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම් කරුවන් පමණක් ඉල්ලුම් කල යුතු අතර තෝරා ගත් අයදුම්කරුවන් අදාළ පුරප්පාඩු සහිත ආයතනයේ වසර පහක අනිවාර්ය සේවයෙන් පසුව පමණක් වාර්ෂික ස්ථාන මාරු සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ලබයි.

2. **නිවාස පාලක (01)**

2.1 වයස් සීමාව :-

අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු සහ 30ට නොවැඩි විය යුතුයි.

2.2 අධ්‍යාපන සුදුසුකම් :-

(අ) සිංහල හෝ දෙමළ හෝ ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ තවත් විෂයයන් දෙකකට (02) සම්මාන සාමාර්ථයන් සහිත ව එක් වරක දී විෂයයන් හය (06) කින් අ.පො.ස (සා.පෙළ) විභාගය සමත් වී තිබීම;

(ආ) අ.පො.ස (උ.පෙළ) විභාගයේ දී අවම වශයෙන් එක් විෂයයකින් හෝ (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත් වී තිබීම.

2.3 වෘත්තීය සුදුසුකම් :-

රජයේ ලියාපදිංචි ආයතනයකින් ළමා සංවර්ධනය පිළිබඳ හෝ සමාජවැඩ පිළිබඳ හෝ නේවාසිකාගාර පාලනය පිළිබඳ මාස තුනකට නොඅඩු පාඨමාලාවක් හදරා සහතිකයක් ලබා තිබීම.

2.4 පළපුරුද්ද :- අදළ නොවේ.

2.5 කායික සුදුසුකම් :-

සෑම අපේක්ෂකයෙකු ම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

2.6 වෙනත් :-

i. ශ්‍රී ලාංකික පුරවැසියෙකු වීම,
ii. අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත වීම,
iii. තනතුරට බඳවාගැනීම සඳහා වන 2.1 සිට 2.6 දක්වා වන සියළුම සුදුසුකම්, එම සුදුසුකම්, සම්පූර්ණ කළ යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කරනු ලබන දිනට සෑම ආකාරයකින් ම සම්පූර්ණ කර තිබිය යුතුය.

2.7 බඳවා ගැනීමේ ක්‍රමය :-

ලිඛිත පරීක්ෂණයේ ප්‍රශ්න පත්‍ර දෙකෙන් ම සමත්, උපරිම ලකුණු සංඛ්‍යාවක් ලබාගන්නා සුදුසුකම් ලත් අයදුම්කරුවන් අතරින් පුරප්පාඩු සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් බඳවා ගැනේ.

2.7.1 ලිඛිත පරීක්ෂණය :-

I. බුද්ධි පරීක්ෂණය - කාලය පැය 01, මුළු ලකුණු 100, සමත් ලකුණු 40%
II. භාෂා හැකියාව - කාලය පැය 01, මුළු ලකුණු 100, සමත් ලකුණු 40%

2.8 වැටුප් පරිමාණය :-

රා.ප.ච. 03/216 අනුව MN 01 - 2016 වැටුප් පරිමාණය රු. 27,140/- 10 x 300-11 x 350 10x495-10x660- රු. 45,540/- වේ.

2.9 සේවා කොන්දේසි :-

මෙම තනතුර ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතය, විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට යටත් විය යුතු අතර වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දයක මුදල් ගෙවිය යුතුය. රා.ප.ච. 01/2014 හා ඊට අනුශංගික චක්‍රලේඛ අනුව වසර පහක් තුළ නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබාගත යුතුය.

2.10 **සටහන** :-

සමාජ සේවා අධ්‍යක්ෂ විසින් තීරණය කරනු ලබන ආයතනයක් මගින් ලිඛිත පරීක්ෂණය කොළඹ දී පැවැත්වේ.

ඉහත සඳහන් සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම් කරුවන් පමණක් ඉල්ලුම් කල යුතු අතර තෝරා ගත් අයදුම්කරුවන් අදළ පුරප්පාඩු සහිත ආයතනයේ වසර පහක අනිවාර්ය සේවයෙන් පසුව පමණක් වාර්ෂික ස්ථාන මාරු සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ලබයි.

අනෝජා හේරත්
සමාජ සේවා අධ්‍යක්ෂ

2023 ඔක්තෝබර් මස 16 වැනි දින,
සමාජ සේවා දෙපාර්තමේන්තුව,
2 වන මහළ
II අදියර
සෙත්සිරිපාය
බත්තරමුල්ල.